# අම්බොක්ක පත්තිනි දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍රයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්.එල්. මූලරාජගේ [1]*

ශ්‍රී ලංකාව පුරා පිහිටුවා ඇති දේවාලවල විවිධ පූජා චාරිත්‍රයන් දෙවියන් වෙනුවෙන් ඉටු කිරීමේදී දේවාල රාජකාරිවල බහුතරය පුරුෂ පාර්ශ්වයේ සහභාගිත්වයෙන් සිදු කරන අතර එහි කාන්තා සහභාගිත්වය ඉතා අවම වෙයි. ස්වභාවයෙන්ම කිළි සහිත යැයි සලකා දෙවියන්ගේ පූජනීය ශුද්ධ වූ කටයුතු සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය අහුරා ඇති අතර දේවතාවියක වූ පත්තිනි දෙවියන්ගේ කටයුතු සඳහා ද මේ තත්ත්වය අදාළ වේ. එම නිසා අනෙකුත් දේවාලවල මෙන්ම පත්තිනි දේවාල තුළ ද රාජකාරි සහ චාරිත්‍ර කටයුතු සඳහා එකම කාන්තා නියෝජනය ආලත්ති අම්මාවරුය. ආලත්ති බෑම සහ දෝලාව අසලින් චාමර සැලීම සියලු දේවාලවල ආලත්ති අම්මාවරුන්ට නියම වූ රාජකාරියයි. නමුත් මාතලේ අම්බොක්ක ග්‍රාමයේ පිහිටුවා ඇති පත්තිනි දේවතාවියට කැප වූ දේවාලයේ ආලත්ති අම්මා අනෙකුත් දේවාලවලදී සිදු කරනු ලබන රාජකාරිවලට අමතරව වෙනත් චාරිත්‍ර කිහිපයක මූලිකත්වය ගෙන කටයුතු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව අම්බොක්ක පත්තිනි දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍ර මොනවාද? යන්න පර්යේෂණ ගැටලුව වන මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ මෙම දේවාලයේ ආලත්ති අම්මා මූලික වූ චාරිත්‍ර හඳුනාගැනීම සහ ඒවා ආලත්ති අම්මා මූලිකව සිදු කිරීමට පසුබිම් වූ හේතූන් අධ්‍යයනය කිරීමයි. ගුණාත්මක ක්‍රමවේදය භාවිතයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය සඳහා සහභාගිත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ද ද්විතියික මූලාශ්‍රය සඳහා පුස්තකාල අධ්‍යයනය ද භාවිත කරන්නට විය. දත්ත විස්තරාත්මක සහ සංසන්දනාත්මක ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණය කරන්නට විය. අනෙකුත් දේවාලවල කපුරාළ විසින් සිදු කරනු ලබන නානුමුර මංගල්‍යය අම්බොක්ක පත්තිනි දේවාලයේදී පත්තිනි අම්මා, කිරි අම්මා යන ව්‍යවහාරයෙන් ද ආමන්ත්‍රණය කරනු ලබන ආලත්ති අම්මා විසින් සිදු කරනු ලබයි. එමෙන්ම වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යයේදී දේවාලයේ තැන්පත් කර ඇති පැරණි පත්තිනි දේව ප්‍රතිමාවට සළු පැලැන්දවීම නම් චාරිත්‍රය සහ ඇසළ පෙරහැර නිමාව සනිටුහන් කරන දිය කැපීමෙන් අනතුරුව සිදු කරනු ලබන කෙණ්ඩිය වැඩමවීම නම් චාරිත්‍රය සිදු කරනු ලබන්නේ ද ආලත්ති අම්මාගේ මූලිකත්වයෙනි. ඒ අනුව ආලත්ති බෑම සහ චාමර සැලීම යන රාජකාරිවලට අමතරව නානුමුර මංගල්‍යය, සළු පැලැන්ද වීම සහ කෙණ්ඩිය වැඩම වීම යන චාරිත්‍රයන් ආලත්ති අම්මා මූලිකව අම්බොක්ක පත්තිනි දේවාලයේ පමණක් සිදු කරනු ලබන බව මෙම අධ්‍යයනයේදී අනාවරණය විය. ජීවමාන අර්ථයෙන් පූජා චාරිත්‍රයන් දෙවියන්ට ඉටු කිරීමේදී දේවතාවියක වූ පත්තිනි දෙවියන්ගේ ස්නානය සිහිපත් කරන නානුමුර මංගල්‍යය සහ වස්ත්‍රයන්ගෙන් සැරසීම සිහිපත් කරන සළු පැලැන්ද වීම පුරුෂයන් සිදු කිරීම නොසුදුසුසේ සැලකීමත් ප්‍රතිමාව ස්පර්ශ කිරීම දිව්‍ය කතාවේ එන පරිදි පත්තිනි මාතාව විසින් රැක ගෙන එනු ලබන පතිවෘතතාව බිඳ දැමීමට හේතුවක් ලෙස සැලකීමත් නිසා මෙම චාරිත්‍රයන් ආලත්ති අම්මා විසින් සිදු කරන බව ද මෙහිදී හඳුනා ගත හැකි විය.

**ප්‍රමුඛ පද:** අම්බොක්ක පත්තිනි දේවාලය, ආලත්ති අම්මා, චාරිත්‍ර, දේවාල රාජකාරි, පත්තිනි ඇදහිල්ල

---

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
mohanlakshitha24@gmail.com